# ගනුදෙනු කලහැකි ලියවිලි - ප්‍රශ්ණ

1. ගනුදෙනු කලහැකි ලියවිලි වලට අදාලව මෙරට බලපාන ප්‍රධාන ව්‍යවස්ථාපිත නීතිය කුමක්ද ?
2. ගනුදෙනු කලහැකි ලියවිල්ලක මූලික ලක්ෂණ 04 ක් ලියන්න.
3. විවිධ ගනුදෙනු කලහැකි ලියවිලි වර්ග කිහිපයක් සඳහන් කරන්න.
4. නීතියෙන් පිලිගත් අර්ධ වශයෙන් ගනුදෙනු කලහැකි ලියවිලි වර්ග වර්ග කිහිපයක් සඳහන් කරන්න.
5. විනිමය බිල්පතක් යනු කුමක්ද ?
6. විනිමය බිල්පතක පාර්ශවකරුවන් නම් කරන්න.

බිල්පත් වර්ගීකරණය

දේශීය බිල්පත් | විදේශීය බිල්පත්

බිල්පත සෑදීම හා මුදල් ගෙවීම යන කාරනා දෙකම මෙරට තුලම සිදුවන විට හෝ බිල්පත සෑදීම මෙරට තුල සිදුව, එහි අණලාභියාද මෙරට ජීවත් වන පුද්ගලයකු වන විට සහ අදාල බිල් පත්‍රය සඳහා ගෙවීම විදේශයකදී වන විට

දේශීය නොවන ඕනෑම බිල්පතක්

▫ ▪ දේශීය බිල්පතක් විදේශයකදී පිටසන් කරනු ලැබුවත්, එය තවදුරටත් දේශීය බිල්පත් ගණයට අයත් වේ.

බිල්පත් වර්ගීකරණය

ඉල්ලූවිට ගෙවිය යුතු බිල්පත් | කාල බිල්පත්

දුටු වහාම හෝ ඉල්ලා සිටි විටක අණ ලද්දා විසින් ගෙවිය යුතු බිල්පත්

අනාගතයේ යම් දිනයකදී අණලද්දා විසින් ගෙවිය යුතු බිල්පත්

7. විනිමය බිල්පතක් ප්‍රතිග්‍රහණය කිරීම යනු කුමක්ද ?
8. අණලාභියා විසින් බිල්පත ප්‍රතිග්‍රහණය කලද, එය වලංගු ප්‍රතිග්‍රහණයක් නොවන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය

සාමාන්‍ය ප්‍රතිග්‍රහණය

අණකරුගේ කොන්දේසි, අණලද්දා විසින්

කොන්දේසි විරහිතව පිලිගැනීම

සීමිත ප්‍රතිග්‍රහණය

අණකරුගේ අණට, අණලද්දා විසින් යම්

කොන්දේසි එකතු කරමින් එය පිලිගැනීම

9. සීමිත ප්‍රතිග්‍රහණයන්ට උදාහරණ දෙන්න.

**□ ■ කොන්දේසි සහිත බිල්පතක් පිලිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බිල්පතක ධාරකයාට ඇත.**

10. බිල්පතක් ප්‍රතිග්‍රහණය සඳහා අනිවාර්යෙන්ම ඉදිරිපත් කල යුතු අවස්ථා මොනවාද ?
11. බිල්පතක් ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කිරීමට අදාල නීතිරීති මොනවාද ?
12. බිල්පතක් ප්‍රතිග්‍රහණය නොකිරීම හේතුකොට ගෙන අගරු වූවා සේ සලකනු ලබන අවස්ථා මොනවාද ?
13. යථාකාලීන ධාරකයා යනු කවරෙක්ද ?
14. යථාකාලීන ධාරකයකුගේ අයිතිවාසිකම් මොනවාද ?

විනිමය බිල්පතක් ගනුදෙනු කිරීම

ධාරක බිල්පත්

හුදු පැවරීමෙන්

ඇණවුම් බිල්පත්

ධාරක විසින් පිටසන් කර පැවරීමෙන්

15. විනිමය බිල්පතක් පිටසන් කිරීම යනු කුමක්ද ?

16. වලංගු පිටසන් කිරීමක තිබිය යුතු අවශ්‍යතා මොනවාද ?

විනිමය බිලක පිටසන් වර්ග

| හිස් පිටසන | විශේෂ පිටසන | කොන්දේසි සහිත පිටසන | සීමාකාරී පිටසන |
|---|---|---|---|
| පිටසන් ලබන්නා සඳහන් නොවේ. ධාරකයාට ගෙවිය යුතුය. | ගෙවිය යුත්තේ කාටද, කාගේ අණටද යන්න සඳහන් වූ අවස්ථාවකි. | පිටසන් කරන්නාගේ අත්සනට යම් කොන්දේසියක් පනවා පනවා ඇති අවස්ථාවකි. | තවදුරටත් ගනුදෙනු කිරීම තහනම් කරයි. උදා - |

17. විනිමය බිල්පතක් ගෙවීම ලබාගැනීම සඳහා අණලාභියා වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන අවස්ථා කිහිපයක් නම් කරන්න.

18. නොගෙවීම මත බිල්පතක් අගරු වන අවස්ථා මොනවාද ?

19. විනිමය බිල්පතක් නිදහස් කළ හැක්කේ කුමන අවස්ථා වලදීද ?

20. පොරොන්දු නෝට්ටුවක් යනු කුමක්ද ?

21. චෙක්පතක් යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

22. බැංකු කරුවෙකු වෙත , යම් තැනැත්තෙකුට ගෙවීම සඳහා ලද පූර්ව නියෝගයක් අවසන් වන ලෙස සලකනු ලබන අවස්ථා මොනවාද ?

23. චෙක්පතක් රේඛණය කිරීම යනු කුමක්ද ?

24. විවිධ රේඛණ වර්ග විස්තර කරන්න.

25. රේඛණය කරන ලද චෙක්පතක් සම්බන්ධයෙන් බැංකු කරුවකුගේ යුතුකම් මොනවාද ?

26. රේඛණය කරන ලද චෙක්පතක් සම්බන්ධයෙන් බැංකු කරුවකුට තිබෙන ආරක්ෂාව කුමක්ද ?

**<u>චෙක්පතක පැවතිය යුතු ප්‍රධාන ලක්ෂණ</u>**

▲ ලිඛිත වීම

▲ කොන්දේසි විරහිත නියෝගයක් වීම

▲ අණලාභියා බැංකුවක් වීම

▲ අණකරු අත්සන් කර තිබීම

▲ නිශ්චිත මුදල් ප්‍රමාණයක් සඳහන් වීම

▲ ඉල්ලූ විට ගෙවිය යුතු වීම

**<u>චෙක්පත් භාවිතයේ විශේෂ වාසි</u>**

■ විශාල වටිනාකමකින් යුත් ගෙවීම් මුදලින් ගෙවනවාට වඩා ආරක්ෂිතව ගෙවීමට හැකියාව ලැබීම සහ පහසු බව.

■ චෙක්පත් වලින් ගෙවීම නිසා කාලය ඉතිරි වේ.

■ ගෙවීම් කල බව පහසුවෙන් ඔප්පු කල හැකිය.

■ චෙක්පත නිකුත් කිරීමත්, එය මුදල් කර ගැනීමත් අතර වන කාල පරතරය මගින් ඇතිවන වාසිය.

■ මුදල් මෙන් ඇතිවිය හැකි දෝෂයන් බොහෝදුරට වලක්වා ගත හැකි වීම.

# <u>ගනුදෙනු කල හැකි ලියවිලි පිලිතුරු</u>

1 . 1927 අංක 25 දරණ විනිමය බිල්පත් ආඥා පනත

2 . 🖋 හුදු භාරදීමෙන් හෝ පිටසන් පිටසන් කර භාරදීමෙන් පැවරුම් ලාභියාට හිමිකම පැවරිය හැකි වීම

🖋 පැවරුම්ලාභියාට එම ලියවිල්ල මත නඩු පැවරීමේ හැකියාව

🖋 ලියවිල්ල පවරන අයගේ හිමිකමේ දෝෂයකින් තොරව පැවරුම් ලාභියාට මනා ශුද්ධ අයිතියක් ලැබීම

🖋 බිල්පත එක් අයෙකුගෙන් තවත් අයෙකු වෙත පැවරීමේදී ඒ සම්බන්ධයෙන් වගකිව යුත්තාට දැනුම් දීමේ අවශ්‍යතාවයක් නොවීම.

<u>ක්‍රවුච් එ. ක්‍රෙඩිට් ෆොන්සියර් ඔෆ් ඉන්ග්ලන්ඩ්</u>

යම් ලියවිල්ලක් වාණිජමය ව්‍යවහරය අනුව මුදල් මෙන් භාරදීම මගින් පැවරිය හැකිනම් සහ

ධාරකයාට තමා නමින් එම ලියවිල්ල මත නඩු පැවරිය හැකි නම් එය ගනුදෙනු කලහැකි ලියවිල්ලක් සේ සැලකෙන අතර සද්භාවයෙන් හා වටිනාකමකට ලබන්නෙකුට එහි හිමිකම පැවරේ.

3 . විනිමය බිල්පත් , චෙක්පත් , පොරොන්දු නෝට්ටු

4 . ලාභාංශ බලපත්‍ර , ධාරකයාට ගෙවිය යුතු අණකර , භාරක ණයකර , භාණ්ඩාගාර බිල්පත් ,

5 . නියමිත පුද්ගලයෙකුට /ඔහුගේ අණට හෝ දරන්නෙකුට යම් න්ශ්චිත මුදල් ප්‍රමාණයක් ඉල්ලූවිට හෝ නිශ්චිත අනාගත දිනයකදී හෝ එහි අණලාභියා විසින් ගෙවිය යුතු බවට , යම් පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුට තම අත්සනින් යුතුව , ලිඛිතව කරන කොන්දේසි විරහිත අණකි.( 3(1) වගන්තිය )

- ⋆ විනිමය බිල්පතකින් නියෝගයක් කල යුතුය. උදා - කරුණාකර ගෙවන්න, ගෙවන්න, ගෙවනු
- ⋆ නමුත් , ගෙවන්නේ නම් මැනවි, ගෙවන්නේ නම් සතුටු වෙමි, වැනි යෙදුම් නියෝග ලෙස පිලි නොගනී.

6 . අණකරු - ගෙවීමක් කිරීමට අණ දෙන්නා, නැතහොත් විනිමය බිල්පතක් ලියා අත්සන් කරන පාර්ශවයයි.

අණකරු සහ ආදායකයා එකම තැනැත්තෙකු විය හැකිය.

අණලද්දා ( අණලාභියා ) - විනිමය බිල්පතක් සඳහා මුදල් ගෙවන ලෙසට අණක් ලබන්නාය. ( මොහු විනිමය බිල්පතේ ප්‍රතිග්‍රාහකයාද වේ.( බිල්පත ප්‍රතිග්‍රහණය කල පසු)

ආදායකයා - විනිමය බිල්පතක් මගින් ගෙවීමක් ලැබීමට හිමිකමක් ඇති තැනැත්තාය. මොහු අණකරුම හෝ වෙනත් අයෙකු විය හැකිය.

ප්‍රතිග්‍රාහකයා - විනිමය බිල්පතෙහි අණ ලද්දා, එය ප්‍රතිග්‍රහණය කල පසු ප්‍රතිග්‍රාහකයා ලෙස හැඳින්වේ.

පිටසන්කරු - විනිමය බිල්පතක්, පිටසන් කිරීම මගින් තවත් කෙනෙකු වෙත පැවරීම කරන්නා

පිටසන්ලදු / පිටසන්ලාභියා - වෙනත් අයෙකු විසින් පිටසන් කල විනිමය බිලක පැවරීම ලබන්නා

ධාරකයා - යම් කිසි අවස්ථාවක විනිමය බිල්පත දරන්නා

7 . විනිමය බිල ප්‍රතිග්‍රහණය කිරීම යනු අණකරුගේ නියමයට අණලාභියා තම කැමැත්ත ප්‍රකාශ කිරීමයි. (නැතහොත් ණය හිමි විසින් එවන ලද බිල්පත,ණය ගැතියා විසින් ගෙවීමට එකඟ වන බවට අත්සන් කොට පිලිගැනීමයි.)

8 .● අණලාභියා විසින් එහි අත්සන් නොකිරීම

● මුදල් ගෙවන බවට හැර වෙනත් ක්‍රමයකට තම පොරොන්දුව ඉටුකරන බව ප්‍රකාශ කිරීම

9 .● විනිමය බිල්පතෙහි සඳහන් වටිනාකමෙන් භාගයක් පමණක් ගෙවීම ( භාගික ප්‍රතිග්‍රහණය )

● විනිමය බිල්පතට මුදල් ගෙවීමට නිශචිත ස්ථානයක් සඳහන් කිරීම ( ප්‍රාදේශික ප්‍රතිග්‍රහණය )

● විනිමය බිල්පතට මුදල් ගෙවීමට නිශ්චිත කාලයක් සඳහන් කිරීම

● අණලාභීන් කිහිපදෙනෙක් ඇති අවස්ථාවක, ඔවුන් අතරිනුත් කිහිපදෙනෙක් පමණක් ප්‍රතිග්‍රහණය කිරීම

★ ★ ★ සීමිත ප්‍රතිග්‍රහණයක් සහිත බිල්පතක් පිලිගෙන භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අභිමතය එහි ධාරකයාට ඇත.

10. ● බිල්පත, දුටු පසු ගෙවිය යතු අවස්ථාවක , ගෙවිය යුතු දිනය තීරණය කිරීම සඳහා ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

● බිල්පත අනිවාර්යෙන්ම ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කල යුතු බව පැහැදිලිවම සඳහන් කොට ඇති විට

● බිල්පත අණලාභියාගේ නිවසේදී හෝ ව්‍යාපාරික ස්ථානයෙන් පරිබාහිර වෙනත් ස්ථානයකදී ගෙවිය යුතු වන විටදී

11. ✖ අණලාභියා මියගොසු ඇති විට ඔහුගේ නීත්‍යානුකූල උරුමකරුවන් වෙත බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කළ යුතුය.

✖ අණලාභියා බුන්වත්ව ඇතිවිට බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා බුන්වත් අණලාභියාගේ දේපල භාරකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

✖ බිල්පත ප්‍රතිග්‍රහණය කළ යුතු ස්ථානයක් තිබේනම්, එම ස්ථානයේදී බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කළ යුතුය.

✖ බිල්පත ඉදිරිපත් කළ යුතු දිනය බැංකු නිවාඩු දිනයක් නම් මීළඟට ඇති ව්‍යාපාරික දිනයේදී බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කළ යුතුය.

✖ ගිවිසුමකින් හෝ භාවිතයෙන් බලය පවරා ඇති විටක බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා තැපෑල මගින් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

✖ බිල්පත කල් ඉකුත්වීමට පෙර, සාධාරණ වේලාවක, ව්‍යාපාර කටයුතු කරන දිනයක ඉදිරිපත් කළ යුතුය.

✖ විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය කිරීමට අදාලව අණලාභීන් කිහිපදෙනෙකු සිටින විට ( හවුල්කරුවන් හැර ) එයින් එක් තැනැත්තෙකුට විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය කිරීම සඳහා බලය පවරා නොමැති විටකදී සියලුම අණලාභීන් වෙත බිල්පත ප්‍රතිග්‍රහණය සඳහා ඉදිරිපත් කළ යුතුය.

12. ✱ බිල්පත ඉදිරිපත් කළ පසු අනලාභියා විසින් සාමාන්‍ය චාරිත්‍රානුකූල කාලසීමාව වන පැය 24 ක් තුළ ප්‍රතිග්‍රහණය නොකිරීම.

✱ අණලද්දා සීමිත ප්‍රතිග්‍රහණයක් සිදු කර ඇති අවස්ථාවක

✱ විනිමය බිල්පතක් ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසුව මුදල් ලබාගැනීමට ඉදිරිපත් කළ විට ප්‍රතික්ෂේප කිරීම

✱ අණලද්දා ව්‍යාජ අයෙකු, මියගිය අයෙකු හෝ ගිවිසුම් ශක්නුතාවය නොමැති අයෙකු වූ විට

✱ අණලද්දා විසින් එම විනිමය බිල්පත ප්‍රතිග්‍රහණය කිරීම ප්‍රතික්ෂේප කිරීම.

13. බැලූ බැල්මට අංග සම්පූර්ණ සහ ක්‍රමවත් බිල්පතක්, කල් ඉකුත් වීමට පෙර, සද්භාවයෙන් හා සාධාරණ මිලකට, මින් පෙර එය අගරු වී ඇත්නම් එලෙස අගරු වූ බවක් නොදැන, බිල්පත ඔහුට හුවමාරු කළ අවස්ථාවේ ගනුදෙනු කළ තැනැත්තාගේ හිමිකම පිළිබඳ ඌනතාවයක් පැවති බවක් නොදැන ලබාගත් අයෙකි.

14. ☛ තමාගේ නමින් බිල්පත මත නඩු පැවරිය හැක.

☛ තමාගේ හිමිකමෙහි දෝෂ තිබුණද, ඔහු බිල්පත සඳහා ගෙවීමක් ලබා ගන්නේ නම් එලෙස නිසි පරිදි

ගෙවන්නෙකුට වලංගු නිදහස් කිරීමක් ලැබේ.

☛ එකී බිල්පත සද්භාවයෙන් ලබාගෙන ඇත්නම්, එය පැවරූ පාර්ශවයේ හිමිකමේ දෝෂයක් තිබුණද එම දෝෂ වලින් නිදහස්ව, බිල්පතෙන් වගකීමට බැඳුණු සියලුම දෙනාට එරෙහිව මුදල් ගෙවීම බලාත්මක කිරීමට හැකිවන ආකාරයට ඔහු විසින් බිල්පත දරයි.

☛ ඔහුට ඔහුගේ නමින් බිල්පත මත නඩු පැවරිය හැකිය.

15. විනිමය බිල්පතක පිටුපස එහි හිමිකරු විසින් හෝ එහි ආදායක විසින් එහි ගෙවීම වෙනත් අයෙකුට ලබාගත හැකි වන සේ හෝ එයට මුදල් ලබාගත හැකි වන පරිදි සිය අත්සන තැබීම හෝ සිය නම ලිවීමයි.

16. ☞ එම බිල්පත මතම පිටසන් කළ යුතුය.

☞ එම පිටසන් කිරීම බිල්පතේ සම්පූර්ණ වටිනාකමටම පිටසන් කිරීමක් විය යුතු

☞ හවුල් කරුවන් නොවන දෙදෙනෙකුට හෝ ඊට වඩා වැඩි ආදායකයන් හෝ පිටසන් ලබන්නන්

සංඛ්‍යාවකට ගෙවිය යුතු වන විටදී අනෙක් අය වෙනුවෙන් ඉන් එක් අයෙකුට පිටසන් කිරීමේ බලය පවරා නැති අවස්ථාවක සියලුම පාර්ශවයන් විසින් එම බිල්පත පිටසන් කළ යුතුය.

17. 🖋සාධාරණ උත්සාහයකින් පසු ( බිල්පතෙහි ගෙවීම් ලබාගැනිම සඳහා ) ඉදිරිපත් කිරීම කළ නොහැකි

අවස්ථාවක

🖋 අණලද්දා ව්‍යාජ පුද්ගලයෙකු වන අවස්ථාවක

🖋 බිල්පතෙහි ගෙවීම් ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමට ඇති අවශ්‍යතාවය ප්‍රකාශිතව හෝ ව්‍යංගයෙන් අත්හැර දැමිය හැකි අවස්ථාවක

🖋 බිල්පත ප්‍රතිග්‍රහණය කරනු ලැබුවේ හෝ තැපෑලට දමනු ලැබුවේ පිටසන්කරුවෙකුට පහසුකම් සලසා දීමට වන අවස්ථාවක සහ බිල්පත ගෙවීම් ලබා ගැනීම ඉදිරිපත් කළ විට ගෙවනු ඇතඅයි විශ්වාස

කිරීමට කිසිඳු සාධාරණ හේතුවකු ඔහුට නොමැති අවස්ථාවක

🖋 බිල්පතෙහි අණලද්දා හෝ ප්‍රතිග්‍රාහකයා බිල්පත ප්‍රතිග්‍රහණය කිරීමට හෝ ගෙවීමට බැඳී නොමැති අවස්ථාවක සහ බිල්පත ගෙවීම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළහොත් එය ගෙවනු ඇතැයි විශ්වාස කිරීමට කිසිඳු සාධාරණ හේතුවක් ඔහුට නොමැති අවස්ථාවක

18.◻ විනිමය බිල්පත නියම පරිදි ගෙවීම සඳහා ඉදිරිපත් කලද, ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක හෝ ගෙවීම ලබාගත නොහැකි අවස්ථාවක

◻ ගෙවීම් ලබාගැනීම සඳහා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කොට ඇති විටක, බිල්පත කල් ඉකුත්ව සහ නොගෙවා ඇති විට

19. ■ අණකරු හෝ ප්‍රතිග්‍රාහකයා විසින් හෝ වෙනුවෙන් විනිමය බිල්පත සඳහා යථා කාලයේදී ගෙවීමෙන්

■ බිල්පත කල්පිරෙන අවස්ථාවේදී බිල්පත ප්‍රතිග්‍රහණය කළ පාර්ශවයම බිල්පතේ ධාරකයා වීම

■ බිල්පතේ ධාරකයා විසින් එය කල්පිරෙන අවස්ථාවේදී සම්පූර්ණයෙන්ම සහ කොන්දේසි විරහිතව එහි ප්‍රතිග්‍රාහකයාට එරෙහිව තමාට ඇති සියලුම අයිතිවාසිකම් අත්හැර දැමීම.

■ ධාරකයා විසින් බිල්පත සිතාමතාම අවලංගු කිරීම.

■ විනිමය බිල්පත් ආඥාපනතේ ප්‍රතිපාදන වලට යටත්ව බිල්පතක් හෝ එහි ප්‍රතිග්‍රහණය, එම බිල්පත පිලිබඳව වගකිවයුතු සියලු පාර්ශවයන්ගේ කැමැත්ත රහිතව බරපතල ලෙස වෙනස් කොට ඇති අවස්ථාවක

<u>**චාල්ස් එ. බ්ලැක්වෙල් -**</u> මෙහිදී X විසින් Y ගේ අණට චෙක්පතක් ලියන ලද චෙක්පතක් R විසින් සොරා ගන්නා ලදී. එම චෙක්පත මත Y ගේ පිටසන කූට ලෙස යොදා R විසින් X ගේ බැංකුවෙන් මුදල් ලබා ගන්නා ලදී. බැංකුව තම සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු අතරතුරදී මෙම චෙක්පත සඳහා මුදල් ගෙවා තිබුණි. මෙහිදී බැංකුවේ නොසැලකිල්ලක් දක්නට නොලැබෙන බැවින් මෙබ චෙක්පත මත බැංකුවේ වගකීම අවසන් වන බව මෙහිදී අධිකරණය තීරණය කලේය.

පිළිසරණ බිල්පතක් නිදහස් වන්නේ පිළිසරණ පාර්ශවය විසින් එය නිසි පරිදි ගෙවා දැමීම මගිනි. මෙහි " පිළිසරණ පාර්ශවය " යනු බිල්පතෙන් වටිනාකමක් නොලැබ, සිය නාමය වෙනත් පාර්ශවයක ප්‍රයෝජනයට ලබාදීමේ අරමුණෙන් බිල්පතේ අණකරු, ප්‍රතිග්‍රාහක හෝ පිටසන්කරු ලෙස අත්සන් කරනු ලබන තැනැත්තෙකු වේ.

20. නියමිත පුද්ගලයෙකුට හෝ දරන්නාට එවන් නියමිත පුද්ගලයෙකුගේ හෝ එකී දරන්නාගේ නියමය මත ඉල්ලා සිටි විටකදී හෝ නියමිත හෝ තීරණය කළ හැකි අනාගත දිනයකදී, නියමිත මුදලක් ගෙවීමට, එකී පොරොන්දුව දෙන අයගේ අත්සන යටතේ, එක් පුද්ගලයෙක් විසින් තවත් පුද්ගලයෙක් වෙත කරනු ලබන කොන්දේසි විරහිත ලිඛිත පොරොන්දුවක්, පොරොන්දු නෝට්ටුවක් නම්වේ.

මෙහිදී පොරොන්දුව දෙන්නේ / පොරොන්දුකරු වන්නේ ණයගැතියා විසින්ය.

පොරොන්දු ලාභියා වන්නේ ණය හිමියාය.

21. චෙක්පතක් යනු ඉල්ලූ විට ගෙවන ලෙස, ගිණුම් හිමියාගේ අත්සන යටතේ, ගිණුම් හිමියා විසින් බැංකුකරු වෙත අණකළ විනිමය බිලකි.

22. ☞ ප්‍රතිනියෝගකරණයක් මගින්

☞ ගනුදෙනුකරු මියගිය බව දැනගන්නට ලැබුණු විට

☞ අණකරුට විරුද්ධව විසුරුවා හැරීමේ පෙත්සමක් පිළිබඳව දැන්වීමක් ලැබුණු විට

☞ අණකරුට විරුද්ධව වස්තු භංගත්ව පෙත්සමක් ඉදිරිපතිව ඇති බවට දැන්වීමක් ලැබුණු විට

23. යම්කිසි චෙක්පතකට ගෙවීම් කවුලුවෙන් නොගෙවිය හැකි බවත්, බැංකු ගිණුමක් හරහා පමණක් ගෙවිය යුතු බවටත්, ගෙවීම කරනු ලබන බැංකුවට කරනු ලබන දැනුම් දීමකි. සමාන්තර රේඛා දෙකක් චෙක්පතේ ඇඳීම මගින් චෙක්පතක් රේඛණය කෙරේ. ඊට අමතරව එම රේඛණය තුල විවිධ වචනද තිබිය හැක.

24. <u>සාමාන්‍ය රේඛණය</u>

චෙක්පතක සමාන්තර රේඛා දෙකක් ඇඳ ඇත්නම් හෝ "සහ සමාගම" යන වචන ඇතිව රේඛණය කර ඇත්නම් එය සාමාන්‍ය රේඛණයකි.

<u>විශේෂ රේඛණය</u>

චෙක්පතක් රේඛණය කර ඒ මත යම් නිශ්චිත වාණිජ බැංකුවක නම සඳහන් කර ඇති අවස්ථාවකි.

( මෙහිදී මෙවන් චෙක්පතක් මත අණලාභී බැංකුව විසින් මුදල් ගෙවිය යුතු වන්නේ, එකී විශේෂ රේඛණයට යටත් බැංකුව වෙත පමණි.)

<u>ගනුදෙනු කළ නොහැක රේඛණය</u>

රේඛිත චෙක්පතක් මත "ගනුදෙනු කල නොහැක" යන වාක්‍ය ඛණ්ඩය ලියා ඇති අවස්ථාවකි. මෙලෙස සටහන් වුවද වෙනත් ඕනෑම චෙක්පතක් මෙන් මෙම චෙක්පතද ගනුදෙනු සඳහා යොදාගත හැකිය. නමුත් මෙම වාක්‍ය ඛණ්ඩය ලිවීමේ නෛතික ප්‍රතිපලය නම්, එවන් චෙක්පතක් කලින් දැරූ තැනැත්තාට තිබූ අයිතිය මිස ඊට වඩා හොඳ ශුද්ධ හිමිකමක් පැවරුම්ලාභියාට නොලැබීමයි.

ආදායකයාගේ ගිණුමට පමණයි රේඛණය

යම් චෙක්පතක නිශ්චිත ආදායකයකුගේ නම සඳහන් කොට එකී චෙක්පත මත "ආදායකයාගේ ගිණුමට පමණයි" යන වචන ලියා ඇත්නම්, එකී චෙක්පත මත මුදල් බැරකළ හැක්කේ එහි නම සඳහන් ආදායකයාගේ ගිණුමට පමණි. මෙවන් චෙකිපතකට කවුන්ටරයෙන් මුදල් ලබාගත නොහැක.

යම් චෙක්පතක මුදල් ගෙවන්නා යන්නට "මුදල්"( cash ) යන වචනය යොදා එම චෙක්පත මත " ආදායකයාගේ ගිණුමට පමණයි " යන වචනය ලියා එය රේඛණය කර ඇත්නම් එවැනි චෙක්පතක් වලංගු නොවන චෙක්පතකි.

25. ▲ යම් චෙක්පතක එකිනෙකට වෙනස්වූ බැංකු දෙකක් වෙත විශේෂ රේඛණ දෙකක් කර ඇත්නම් (,එම රේඛණයෙහි සඳහන් බැංකු දෙකෙන් එකක් අනෙක් බැංකුවෙහි නියෝජිතයෙක් ලෙස ක්‍රියා කරන්නේ නම් මිස ඒ හැර ) එම රේඛණය වලංගු නැත.එම නිසා එම චෙක්පත සඳහා මුදල් ගෙවීම අණලාභී බැංකුව විසින් ප්‍රතික්ෂේප කළ යුතුය.

▲ චෙක්පතක් එක් බැංකුකරුවෙකුට වඩා වැඩි බැංකුකරුවන් සංඛ්‍යාවකට විශේෂිතව රේඛණය කළ විට, එම චෙක්පතේ අණලාභී බැංකුකරු ඒ මත ගෙවීම් සිදු කළේනම් එම බැංකුකරු චෙක්පතේ නියම හිමිකරුට වගකීමට බැඳේ.

▲ චෙක්පතෙහි සාමාන්‍ය රේඛණයක් කර ඇති අවස්ථාවක එම චෙක්පතෙන් අණලද බැංකුකරු, බැංකුකරුවකු නොවන වෙනත් වෙනත් පාර්ශවයකට ගෙව්වේ නම්, එම බැංකුකරු චෙක්පතේ නියම හිමිකරුට වගකිව යුතුය.

26. ● අදාල චෙක්පත මත සද්භාවයෙන් හා නොසැලකිලිමත් බවෙන් තොරව ගෙවීමක් කළ අණලාභී බැංකුකරුවෙකු, එම චෙක්පත මත එහි නියම හිමිකරුට ගෙවූ විට ඇතිවන අයිතිවාසිකම් හා තත්වයට හිමිකම් ලබයි.

● අදාල චෙක්පත මත සද්භාවයෙන් හා නොසැලකිල්ලෙන් තොරව ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් රේඛණය කළ චෙක්පතක ගෙවීමක් ලබාගත් විට, එම ගනුදෙනුකරුගේ හිමිකම දෝෂ සහිත වුවත්, එහි නියම හිමිකරුට බැංකුව විසින් වග කිව යුතු නැත.

පිළිසරණ විනිමය බිල්පතක් යනු - යම්කිසි ගෙවීමක් පියවීම සඳහා නොව, අණකරුගේ මූල්‍ය අවශ්‍යතා පියවීම සඳහා උපකාරී වීම සඳහා යමෙකු විසින් අණලාභිය ලෙස ප්‍රතිග්‍රහණය කරන බිල්පතකි.

පිළිසකර විනිමය බිලපතක් යනු - විනිමය බිලට මුදල් ගෙවිය යුතු අවසාන දිනයේදී මුදල් ගෙවිය නොහැකි වුවහොත්, එම බිල්පතේ දිනය තවදුරටත් ඉදිරියට ගෙන යමින් අලුත්වැඩියා කරනු ලැබුවහොත් එවන් ආකාරයේ බිල්පතකි.

විරෝධය පිට ගරුත්වය සඳහා ප්‍රතිග්‍රහණය යනු - බිල්පතක් අගරු වී ඇතිවිට ( අගරු වීම නිසා විරුද්ධත්වයක් ඇති විට ) එම බිල්පත සඳහා දැනටමත් වගකිවයුතු පාර්ශවයක් නොවන ඕනෑම අයෙකුට, ධාරකයාගේ අවසරය ඇතිව, බිල්පතෙහි ඕනෑම පාර්ශවයක ගරුත්වය සඳහා ( එනම්, බිල්පත වෙනුවෙන් ගෙවීම සඳහා ) එම බිල්පත ප්‍රතිග්‍රහණය කිරීමයි.

එවන් අවස්ථාවකදී ඒ බව බිල්පත මත ලිවිය යුතු අතර එලෙස ප්‍රතිග්‍රහණය කරන්නා විසින් ඊට අත්සන් කළ යුතුය.

**ප්‍රොස්පරිටි එ. ලොයිඩ් බැංකුව** නඩුවේදී බැංකුවක් විසින් කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව චෙක්පතකට මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කල අවස්ථාවකදී එමගින් සිය කීර්ති නාමය හානියට පත් ගනුදෙනුකරුවෙකුට අදාල බැංකුව වෙතින් වන්දි ලබා ගැනීමේ හැකියාවක් පවතින බව තීරණය විය.